මහේස්ත්‍රාත් අධිකරණය
3 SEP 1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 28 දරන ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 02 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 28 දරන ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 02 වන දින.]

එල්. ඩී.—ඕ. 13/86.

**1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

කෙටි නාමය.

1. මේ පනත 1987 අංක 28 දරන ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1969 අංක 1 දරන පනතේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. 1985 අංක 48 දරන පනතින් සංශෝධිත මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍ර මගින් ප්‍රදානය කෙරෙන බලය.

8. යම් තැනැත්තකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් මගින්, ඒ බලපත්‍රයේ නිශ්චිතව දැක්වෙන යම් වටිනාකමකින් සහ ප්‍රමාණයකින් හෝ ප්‍රමාණවලින් යුත් භාණ්ඩ, ඒ බලපත්‍රයේ දැක්වෙන කොන්දේසිවලට සහ මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයකට යටත් ව, ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට හෝ ඒ තැනැත්තාට බලය දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11ඉ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 11ඉ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"නියෝග උල්ලංඝනය කරන ආනයන කරුවන්ගේ ලැයිස්තුවක් පළ කිරීම.

11ඉ. යම් භාණ්ඩයක් සඳහා මේ පනත යටතේ සාදන ලද නියෝගවල නිශ්චිතව නියම කොට ඇති ප්‍රමිතිවලට අනුකූල නොවන පරිදි ඒ භාණ්ඩය යම් ආනයනකරුවකු විසින් ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති බවට පාලකවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ජාතික ආර්ථිකයේ හිත පිණිස සහ මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම පිණිස, ඒ ආනයනකරුගේ නාම සහ ලිපිනය ද, ඒ ආනයනකරුගේ අනන්‍යතාව නිසැකව හඳුනාගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තොරතුරු ද දැක්වෙන ලැයිස්තුවක්, පාලකවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" වැරදි සම්බන්ධයෙන් දඬුවම්.

17.(1) මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්ම වන කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු අතර, ප්‍රමිති හෝ තත්ත්ව පාලනය සම්බන්ධයෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග කිසිවක් උල්ලංඝනය කරමින් කරන ලද භාණ්ඩ ආනයනය කිරීමකට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ භාණ්ඩ රජය සන්තක කළ යුතු බවට මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් රජය සන්තක කරන ලද භාණ්ඩ කිසිවක් එසේ රජය සන්තක කරනු ලැබූ විට පූර්ණ වශයෙන් රජය සතු විය යුතු අතර ඒ රජය සතුවීම—

(අ) රජය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනයක් කර නොමැති අවස්ථාවක, රජය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඉකුත් වීමෙන් පසුව ; නැතහොත්

(ආ) රජය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, රජය සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් ඒ අභියාචනයෙහි ලා තීරණයක් දෙනු ලැබූ විට

බලසහිත විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රජය සතු කරන ලද භාණ්ඩ කිසිවක සන්තකය පාලක වරයා විසින් දැරිය යුතු අතර, සුදුසු යයි පාලක වරයා කල්පනා කරන ආකාරයෙන් ඒ භාණ්ඩ විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය. පාලකවරයා විසින් ඒ භාණ්ඩ කිසිවක් විකුණනු ලබන අවස්ථාවක, ඒ විකිණීමෙන් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) යම් නිශ්චිත පංතියකට හෝ විස්තරයකට අයත් අපනයනය කළ හැකි හෝ ආනයනය කළ හැකි භාණ්ඩ වල ප්‍රමිති විධිමත් කිරීම හා තත්ත්ව පාලනය කිරීම.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.